# ඉරානයේ රාජ්‍ය පාලන ප්‍රතිපත්තිය ලෙස ස්ත්‍රී දූෂණ, ශාරීරික වධ හිංසා සහ සිරකරුවන් මරා දැමීම.

2009 සැප්තැම්බර් 07 ''A World to Win'' (දිනා ගැනුමට ලොවක් ඇත) ප්‍රවෘත්ති සේවය.

මහ ජනතාවට එරෙහි ව, වර්ෂයක් පාසා සිදුවන මර්ධනය හා දුෂ්ඨ වධ හිංසා පීඩනයට එරෙහි විරෝධතා දක්වන, විශේෂයෙන් තරුණයන්ට එරෙහි ව, ඉරාන ඉස්ලාමීය ජන රජය අඛණ්ඩව සිදු කරන අපරාධ, නීති විරෝධී ක්‍රියාවන්ගේ සීමාවක් නොපෙනේ.

මෑත කාලයේදී මරා දමනු ලැබූවන් අතර 17 ත් වියැති ෂයිඩා ආයී (Saeedeh Aghaee) දැරියද විය. ඇය මිහිදන් කර ඇත්තේ ටෙහෙරාන්වල බිහෙස්ට් ෂාරා සුසාන භූමියේ 302 වන කොටසේ, ඇගේ නම සහිත පුවරුවද නොමැතිවය. ඇයට වධ හිංසා පමුණුවා, දූෂණය කොට අන්තිමේදී ඇසිඩ් වත් කර සිරුරට ගිනි දමා තිබුණෙන් දූෂණය හා වධ හිංසන පිළිබඳ කිසිදු සාක්ෂියක් හසු නොවන පරිදි විනාශ කිරීමෙන් යන්න වාර්තා වී තිබේ.

වහලක් මත නැගී ඇය සටන් පාඨ හඬ නගමින් සිටියදී සිවිල් ඇඳුමින් සැරසුණු බාසිජී හමුදා භට (Basiji militiamen) පිරිසක් විසින් ෂයිඩා අත් අඩංගුවට ගන්නා ලදි. පසුව දකුණු ටෙහෙරානයේ මළ කඳන් ගොඩ ගසා තිබුණු ශීත කාමරයක තිබී දින 20 කට පසුව ඇගේ මළ සිරුර ෂයිඩාගේ මව විසින් හඳුනාගෙන ඇත. එහෙත් බලධාරීන් ඇගේ සිරුර මවට බාර දීම ප්‍රතික්ෂේප කර ඇති බව Deutsche Welt, පර්සියානු වෙබ් අඩවියේ පෙන්වන ලද, ඉරාන මානව හිමිකම් ක්‍රියාධරයෙක් සමග පැවති සම්මුඛ සාකච්ඡාවකදී හෙළි වී ඇත.

ෂයිඩා ගේ මළ සිරුර බාර දීම සඳහා විශාල මුදලක් ඇගේ මවගෙන් ඔවුහු ඉල්ලා ඇත. නමුත් ඇගේ පවුලේ උදවියට එවැනි මුදලක් දීමට නොහැකි විය. සති කීපයකට පසු ඇගේ පවුලේ සාමාජිකයින්ට දැන ගන්න ලැබුණේ බිහෙස්ට් ෂාරා සුසාන භූමියේ රහසිගතවම ඇය වළ දමා ඇති බවයි. සමහර වාර්තාවලට අනුව ඇය මිය ගියේ ''වකුගඩු නරක් වීමෙන්'' බව පැවසීමට ඇගේ පවුලේ සාමාජිකයින්ව පොළඹවා තිබේ. එනමුත් ෂයිඩාට එවැනි අයහපත් සෞඛ්‍ය තත්ත්වයක්, වකුගඩු ආබාධයක් තිබී නැත. වකුගඩු නරක් වීමෙන් ෂයිඩා මිය ගියේ යැයි කියන ආරංචි පළ වීමෙන් ඇගේ ඥාති මිත්‍රාදීන් පුදුමයට පත් විය; එහි වලංගුභාවය ගැන ඔවුන් සැක පහළ කළහ. මෙවැනි අඥාත හෙළිදරව් කිරීම් වලින් පැහැදිලි වුයේ ඇය මරා දමා ඇති බවයි. දැඩි කායික හා මානසික වේදනා විඳ මරණයට පත් ෂයිඩා පිළිබඳ ප්‍රවෘත්තිය සමහරවිට හඟවන්නේ ආරක්ෂක හමුදා සහ බාසිජී භට පිරිස් විසින් ම්ලේච්ඡ ලෙස දූෂණය කර මරා දමන ලද තරුණියන්ගේ නන්නාඳුනන මළ සිරුරු 302 සුසාන භූමි භාගයේ රහසිගතව මිහිදන් කර ඇති බවයි. ප්‍රශ්න කිරීම සඳහා අත් අඩංගුවේ පසුවූ 18 හැවිරිදි තරුණ කාන්තාවක් වන, තාරේනා මව්සාවි (Taraneh Mousavi) මෙලෙස දූෂණය කොට මරා දමන ලදි. පසුව ඇගේ සිරුර පුළුස්සා, ගාෂ්වින් (Ghazvin) (ටෙහෙරානයේ දකුණු නගරයක් වන) මහා මාර්ගය අසල දමා ගොස් තිබුණි. ජූනි 28 දා පැවති විරෝධතා උද්ඝෝෂණයේදී තාරෙනා අත් අඩංගුවට ගෙන තිබේ. අත් අඩංගුවට පත් අනෙක් රැඳවියන්ගෙන් ඇය වෙන් කර ඇත. ඇය සමග අත් අඩංගුවට ගත් එක් මිතුරියක් එදිනම නිදහස් කර තිබේ. ඉන්පසු සති 3 ක් වන තුරු ඇය රඳවාගෙන සිටින ස්ථානය පිළිබඳ කිසිදු ආරංචියක් නොවීය. ඇගේ යෝනි මාර්ගයේ දරුණු තුවාලයක් නිසා ඇය රෝහල් ගත කර ඇති බවට ඇගේ පවුලේ අයට දුර කථන පණිවිඩයක් ලැබී තිබේ. පසුව ඔවුන් එම රෝහලට ඇමතුමක් දුන් අවස්ථාවේ ඇය ඒ වන විටත් වෙනත් නොදන්නා පළාතකට මාරු කර යවා තිබුණි. ජූලි 14, www.peykeirn.com වෙබ් අඩවිය වාර්තා කර තිබුණේ ඇය අතුරුදහන්ව ඇති බවයි. ජූලි 17 ඇගේ මළ සිරුර හමුවන තුරු පාලක රජය එය ප්‍රතික්ෂේප කර තිබුණි.

තාරෙනාට සිදු කරන ලද දූෂණය හා මරා දැමීම පිළිබඳ ආරංචිය කෙතරම් ප්‍රකම්පනයට පත් කළේද කියනවා නම් සමහර මිනිසුන්ට එය විශ්වාස කිරීමට පවා අපහසු විය. ඒ නිසා පාලන රජයේ රූපවාහිනී මාධ්‍ය තව දුරටත් ප්‍රකාශ කර සිටියේ තාරෙනා තවමත් ජීවතුන් අතරේ පසුවන බවයි. එම ප්‍රවෘත්තිය තහවුරු කිරීම පිණිස කැනඩාවේ ජීවත්වන තාරෙනා මව්සාවි යන නාමයෙන් යුත් කාන්තාවක් සමග පාලන රජය මාධ්‍ය සම්මුඛ සාකච්ඡාවක් ද පවත්වා තිබේ. මෙම මාධ්‍ය වැඩ සටහන විශ්වාසනීයත්වයෙන් තොර බව ඇතැම් පාර්ලිමේන්තු මංත්‍රීවරු පවා ප්‍රකාශ කර තිබේ. සති කිහිපයක් තිස්සේ මේ පිළිබඳ පැවති මතබේද ආරවුල් වලින් අනතුරුව, මැතිවරණයට පසු අත් අඩංගුවට පත් සහ තුවාල ලැබූ පුද්ගලයන්ගේ අයිතිවාසිකම් පිළිබඳ ක්‍රියාත්මක කමිටුවේ සාමාජිකයකු වන මෝර්ටෙසා අල්වයිරි (Morteza Alviry) නිවේදනය කළේ බලධාරීන් විසින් තාරෙනා මව්සාවි මරා දමා ඇති බවයි. He criticized the Islamic Republic's Channel 2 for broadcasting a fabricated story. තාරෙනාගේ පවුලේ උදවියට ඒ පිළිබඳ හුස්මක් වත් හෙළීමට නොහැකි දැඩි පීඩනයකට හසු කර තිබුණු බවට කිසිදු සැකයක් නැත. එමතුදු නොව සම්මුඛ සාකච්ඡාවකට හෝ ප්‍රසිද්ධියේ කථා කිරීමට පවා ඔවුන්ට අවසර දී නොතිබුණි.

මින් පෙනී යන්නේ ෂයිඩා සහ තාරෙනා මෙලෙස නපුරු, දුෂ්ඨ හා විෂම අපරාධ වලට ගොදුරු වූ එකම කාන්තාවන් දෙදෙනා නොවන බවයි. 302 සුසාන භූමියේ මෙලෙස හොර රහසේ මරා වල දමන ලද තරුණියන් පිළිබඳ එළිදරව් වීම, බිහෙස්ට් ෂාරා සුසාන භූමිය අසල සමූහ මිනී වලක් පිළිබඳ ප්‍රවෘත්තිය සහ සොහොන් පිටිය පුරා ඉවතට ඇද දැමූ තැන තැන විසිරී තිබුණු ගර්භාෂ පිළිබඳ සඳහන් මගින් සැක සංකා වඩ වඩාත් තහවුරු වෙමින් පවතී.

බන්ධනාගාර වලදී තරුණ පිරිමි ළමුන්ද පසුගිය මාස කීපය තුළ පුරාම ලිංගික අපචාරවලට යොදා ගෙන තිබුණි. ජූලි 01 දා තරම් මෑත දිනක, ''උද්ඝෝෂණ කාල වකවානුව තුළ මරා දමා ඇති අය සහ රඳවාගනු ලැබූ අය පිළිබඳ නිරීක්ෂණය කර ගැනීම සඳහා ව්‍යාපෘතියක්'' යන මැයෙන් ඉරානයේ, The Guardian හි, ඉරානයේ නිරිත දිග ෂයිරාෂ් (Shiraz) වල සාප්පු හිමියෙක් වන අෆ්ෂින් (Afshin) විසින් පළ කරන ලදි. තම මිතුරන්ගෙන් කෙනෙක් අත් අඩංගුවට ගෙන තලා පෙලා පහර දී කීප වරක් දූෂණය කරන ලද බව අෆ්ෂින් එක්සත් ජනපද පුවත්පතකට පවසා තිබේ. අත් අඩංගුවෙන් මිදී ඔහුගේ එම මිතුරා අෆ්ෂින්ව බැහැ දැකීමට පැමිණ තිබේ. ''ඔහුගේ උරහිස්, බාහු වල හා අත්වල තුවාල තිබුණි. ඔහුගේ මුහුණේ දිගටි කැපුම්

පහරවල් දක්නට තිබුණි. ඇට කටු බිඳී නොතිබුණද, ශරීරය පුරා සීරීම් හා පහුරු ගෑ සලකුණු විය.... සම්පූර්ණයෙන් හානි නොවූ දත් හතරක් හැර අන් සියල්ලම කැඩී බිඳී ඇති බව වෛද්‍යවරයා සඳහන් කළේය. ඔහු පැවසූ දේ කුමක්ද? යන්න ඔබට සිතා ගැනීමටවත් නොපුළුවන... සිදුවී ඇති දෙය වෛද්‍යවරයා මට පැවසීය. වහාම ඔහු රෝහල් ගත කරන ලෙස ඔහු අපට යෝජනා කළේය.''

මෙම ව්‍යසනයට මුණ පෑ ඔහු කෙතරම් මානසික ආතතියකට පත් වී සිටියේද කියනවා නම්, ''ඔහු වෙනුවෙන් මුදල් වියදම් කිරීම අපතේ යෑමක් බැවින් තමා දිවි නසා ගන්නවා'' යැයි හේ පැවසීය. ''The Guardian'' හි ලියා තිබුණේත් ස්වාධීනව මෙම වාර්තාවේ සත්‍යතාවය ඔප්පු කිරීමට තරමක් අපහසු බවයි. එසේවී නමුදු, ගිණිය නොහැකි තරම් වාර්තා, ප්‍රවෘත්ති, ටෙහෙරාන් වලත්, අනෙක් නගර වලත්, හෙළිදරව් කර තිබුණේ ඉරාන රාජ්‍ය පාලනයට එරෙහිව ධෛර්ය සපයන ලෙස සටන් කළ විරෝධතා කරුවන් වන තරුණ ඉරාන ජාතිකයන්ගේ ආත්මය, ජීව ගුණය සිඳ බිඳ දමන අරමුණින් ක්‍රමානුකූලව සැලසුම් කරන ලද කෲර වද හිංසා පැමිණවීමක් ලෙසිනි. තරුණ ගෑනු ළමුන් හා පිරිමි ළමුන් දූෂණය කර ඇති බවයි.

ලිපියක් හරහා මෙවැනි සිදුවීම් දසත පුරාම ඉස්ලාමීය ක්‍රමය තුළ ප්‍රචලිත වීම පොදුවේ පාලන බල ව්‍යුහයම දෙදරා ගොස් ඇත. මෙහ්දි කාරෝබි (Mehdi Karoubi), ජනාධිපති අපේක්ෂකයන් දෙදෙනා ගෙන් කෙනෙක්, සිරකරුවන්ට සිදු කරනු ලබන අපයෝජන පිළිබඳ අයතුල්ලා අලි අක්බාර් රෆ්සන්ජානිට (Ayatollah Ali Akbar Rafsanjani) ලියා දක්වා ඇත. (ඔහු මධ්‍යම රජයේ පුද්ගලයෙක් මෙන්ම ජනාධිපති මොහොමඩ් අහමදිනිජාද් ගේ කට්ටිවාදී විරුද්ධ පාක්ෂිකයාය.) රෆ්සන්ජානි කිසිදු ප්‍රතිචාරයක් නොදැක්වූ හෙයින් කරෝබි මෙම ලිපිය ප්‍රසිද්ධියට පත් කළේය.

''අත් අඩංගුවේ පසුවන සමහර පුද්ගලයෝ කියා තිබුණේ අත් අඩංගුවට පත් සමහර තරුණ කාන්තාවන්ව කෙතරම් කෲර හා මෘග ලෙස දූෂණය කර තිබෙනවාද කියනවානම්, ඔවුන්ගේ යෝනි මාර්ගයේ ඇති වූ තුවාල සහ පිපිරියාම් නිසා ඔවුන් දැඩි වේදනාවක් අත් විඳින බවයි. තවද අත් අඩංගුවට පත් වූ තරුණ පිරිමි දරුවන් මෘග ලෙස දූෂණය කිරීම නිසා ඔවුන් තදබල ආතතියකින්, කායික වේදනාවකින් හා මානසික ගැටළුවකින් පීඩා විඳිනවා පමණක් නොව, ඔවුන්ගේ නිවෙස් වල ද, ඔවුහු අඳු මුලු වලට වී කාංසාවෙන් පසු වෙති.''

ප්‍රධාන පෙළේ පාලන ආණ්ඩුවේ බලධාරීන් විසින් මෙම ලිපියට ආවේගශීලී ප්‍රහාර එල්ල කර තිබේ. සිර ගෙවල්වල එවැනි කිසිදු දූෂණයක්, ලිංගික අපරාධයක් සිදුවී නොමැති බවත්, සාක්ෂි නොමැතිව කරෝබි නගන අපවාදයට දෝෂාරෝපණය කරමින්, පාර්ලිමේන්තු කථානායක අලි ලාරිජානි (Ali Larijani) සියල්ල අසත්‍ය යැයි ප්‍රකාශ කර ඇත. සාධාරණ පරීක්ෂණයකින් තොරව ලාරිජානි විසින් ගත් ස්ථාවරය පිළිබඳ කරෝබි චෝදනා කළේය. ඔහු තව දුරටත් කියා සිටියේ ඔහුට ඒ පිළිබඳ සාක්ෂි තිබෙන බවයි; නමුත් ඒවා අනාවරණය කිරීමට පෙර විපතට පත් පුද්ගලයන් සිරෙන් නිදහස් වීම පිළිබඳ සහතිකවීමක් සඳහා ඔහු අපේක්ෂාවෙන් සිටින බවයි. වෙනත් විකල්පයක් නොමැතිව අවසානයේදී මතු වී ඇති ගැටළුව විසඳීම සඳහා විශේෂ පාර්ලිමේන්තු කොමිසමක් පත් කිරීමට සිදු විය. දූෂණ, ලිංගික අපචාර හා කායික මානසික කෲර වධ හිංසා පැමිණ වීම සම්බන්ධයෙන් වගකිව යුතු ප්‍රධාන නායකයින් හා අණදෙන නිළධාරීන්ගෙන් සැදුම්ලත්-පාලන ආණ්ඩුවේ කොමිසම සැබවින්ම මෙම නඩු සාධාරණව විනිශ්චය කරාවි යන්න කිසිවෙක් අපේක්ෂා නොකරති. ආරක්ෂක හමුදා විපතට පත් වූවන් තදින් භීතියට පත් කළ අතර කොමිසම උත්සාහ කළේ සියළු සාධක අකාමකා දැමීම සඳහායි.

ඉතා ප්‍රසිද්ධියට පත් වූ සමහර සිදුවීම් සම්බන්ධයෙන් පවා දූෂණයන්ට හා වධ බන්ධනයන්ට ගොදුරු වූ පුද්ගලයන් නිහඬ කර වූයේ, ඔවුන් නැවත අත් අඩංගුවට ගන්නවා යැයි බියට පත් කිරීමෙන් හා ඔවුන්ගේ සහෝදර සහෝදරියන්ටත් එවැනිම ඉරණමක් අත්කර දෙන බවට තර්ජනය කිරීමෙන්ය.

එක් තරුණ පිරිමි ළමයෙක් අත් අඩංගුවට ගෙන දූෂණය කළ බවට පැහැදිලි සාක්ෂියක් වෙයි. එනම් මෙම තරුණයාගෙන් නැවත ප්‍රශ්න කිරීමට හමුදාවෙන් කැඳ වූ නිසා ඔහු පාලමකින් පැන අන්තිමේදී සිය දිවි හානි කරගැනීමෙන් වන්දි ගෙවීය. ලේ විලක් මැද වැතිරී සිටි ඔහුගේ මළ සිරුර දැක ඔහුගේ පියා ඉරාන ඉස්ලාමීය ජන රජයට ශාප කරමින් කෑගසන සේයා පටය ප්‍රසිද්ධියට පත්ව තිබුණි.

ජනාධිපති මොහොමඩ් අහමදිනිජාඩ් නීත්‍යානුකූල නොවන ප්‍රචණ්ඩ ලෙස බලයට පැමිණීමෙන් පසු තරුණ පිරිමි ළමුන් දූෂණය කිරීම එක්තරා මට්ටමක නව ප්‍රපංචයක් විය හැකි අතර පාලන රජයේ මුල් දිනවල සිටම කාන්තාවන් දූෂණය කිරීම ක්‍රමානුකූලව යොදා ගෙන තිබුණේ කාන්තාවන් දැඩි කායිකව හා මානසිකව පීඩාවට පත් කිරීම පිණිසයි. කාන්තාවන්ගේ වෛරය ඉස්ලාමීය ජන රජයේ හරයාත්මක අනන්‍යතාවයේ පාර්ශවයක් වෙමින් තිබේ. එකල අත් අඩංගුවට පත් විප්ලවීය කොමියුනිස්ට් සංවිධානවල සාමාජිකයින් හා ආධාරකරුවන් අතර කන්‍යාවන් ලෙස සිටි කාන්තාවන් පාලන ආණ්ඩුවේ පාලකයින් විසින් දූෂණය කර ඇත්තේ ඔවුන්ව මරා දැමීමට පෙරයි. ඉතා අසාධ්‍ය තත්ත්වයේ පසුවන කාන්තාවන් පවා තාවකාලිකව වධකයන්ට හෝ හිර ගෙදර නිළධාරීන්ට පාවා දෙන ලදි; එවැනි ස්ත්‍රී දූෂණවලට ආගමික සුජාතභාවයේ ඉඩ හසර පැවතිණි. මුලදී මේවා සිදු කරන ලද්දේ ආගමික අරමුණු හෝ අදහස් වලට මුවා වීමෙන්; මරණින් මතු මෙසේ ඝාතනය කර දමන කාන්තාවන් කිසි විටක ස්වර්ගයට පා තැබිය නොහැකි බව පවසමින්ය. නමුත් 1980 ගණන් වල බොහෝ දේශපාලන සිරකරුවන් මරා දැමීමෙන් පසු, ඉස්ලාමීය ජන රජය ස්ත්‍රීන්ව දූෂණය කිරීම දිගටම පවත්වා ගෙන ගියේ වධ බන්ධන පමුණුවා සිර කරුවන්ගේ අධිෂ්ඨානය කඩා බිඳ දැමීමේ ක්‍රම වේදයක් ලෙසයි; එමෙන්ම එසේ කිරීමේ අදහස වූයේ පාපොච්චාරණයක් ලබා ගැනීම නැතිනම් පොදුවේ සිරකරුවන්ගේ අධ්‍යාත්මික ශක්තිය කඩා බිඳ හීන කිරීමය.

විරුද්ධ පක්ෂ නායක කරෝබි සහ මීර්-හුසේන් මව්සාවි ප්‍රබල කම්පනයක් ඇති කිරීමට මහන්සි වන්නේ සිරකරුවන් දූෂණය කිරීම දැන් අරුම පුදුමයක් සේ පෙනුණු විටයි. හද සසලවන අයුරින් දූෂණය කිරීම් මහා පරිමාණයෙන් අද සිදු කරන අතර 1980 ගණන් වල මව්සාවි අගමැතිව සිටි කාලයේදීත්; 90 ගණන්වල කරෝබි පාර්ලිමේන්තු සභා නායකව සිටි කාලයේදීත්; සිර කරුවන්, සිර කාරියන් ක්‍රමානුකූලව දූෂණය කිරීම රාජ්‍ය ප්‍රතිපත්තියක් වී තිබුණි. රාජ්‍ය පාලනයේ අධ්‍යාත්මික නායක අයතුල්ලා කොමෙනිගේ ඍජු හෝ වක්‍ර අනුමැතියකින් තොරව එම අපරාධ හා දූෂණයන්ට මුල පිරීමට හා පවත්වාගෙන යාමට

ඉඩක් නොවිය. ඒවා කොතරම් පුළුල්ව පැතිර ගියේද කියනවානම්, එකල උත්තරීතර නායක පදවි ප්‍රාප්ත වීමට තදින් දෝෂාරෝපණය ලද අයතුල්ලා අලි මොන්ටෂාරි (Ayatollah Ali Montazeri) 1986 ඔක්තෝබර් 09 දින, සමහර විට ලිපියකින් ව්‍යාජාලංකාරාත්මක ලෙස විමසා සිටියේ ''වධ හිංසා පමුණුවා විශාල ප්‍රමාණයක් සිරකරුවන් මරා දමා ඇති බව ඔබ දන්නවාද? මාෂ්හැඩ් (Mashhad) වල සිර ගෙවල සිදුවී ඇති දේ සම්බන්ධයෙන් තරුණ කාන්තාවන් 25 දෙනෙකුගේ ඩිම්බකෝෂ හෝ ගර්භාෂයන් බලයෙන් ඉවත් කර ඇති බව ඔබ දන්නවාද? සමහර ඉස්ලාමීය ජන රජවල සිරගෙවලවල තරුණ කාන්තාවන්ගෙන් ප්‍රශ්න කරන අතරතුර ඔවුන්ව බලහත්කාරයෙන් දූෂණය කරන බව ඔබ දන්නවාද? යනුවෙනි.''

පසුගිය දශකය පුරාම මෙවැනි අපරාධ වල ව්‍යවහාරය හා ක්‍රියාමාර්ගය දිගින් දිගටම පැවතිණ. මෙම නින්දිත, දුෂ්ඨ හා අපකීර්තිමත් සිදුවීම් වලින් එකක් වන්නේ ෂාරා කාෂෙමයි (Zahra Kazemi), ඉරාන-කැනඩා මාධ්‍යවේදිනිය 2003 ජූලි මස තුළ සිරභාරයේ පසුවෙද්දීම මරා දැමීම පිළිබඳ සිදු වීමය. මෙම නඩු විභාගය වෙනුවෙන් පෙනී සිටි නීතිඥයෝ විශ්වාස කරන්නේ සායිඩ් මෝ(ර්)ටාෂවයි (Saeed Mortaz) යන විනිසුරු ඇයට දස වද දී මරා දමන ලෙසට නියෝග කර ඇති බවයි. තවත් එවැනිම සිදු වීමක් නම් වෛද්‍යවරියක් වන ෂාරා බානියාවුබ් (Zahra Baniyaghoub), හැමේඩන් (Hamedan) වලදී ආරක්ෂක හමුදා විසින් අත් අඩංගුවට ගැනීමයි. මේ වෛද්‍යවරිය දූෂණය කොට මරා දැමීමෙන් පසුව, ඇය සියදිවි නසා ගත්බව බලධාරීන් විසින් නිවේදනයක් නිකුත් කරන ලදි. ඇටිෆේ රාජාබයි (Atefeh Rajabi), 16 හැවිරිදි දැරිය, උතුරු නගරයක් වන නේකාහිදී (Neka) නඩු අසන මහේස්ත්‍රාත්වරුන් විසින් දූෂණය කරන ලදි. ඇයගේ ලාබාල වයස ගැනද නොතකා, පුද්ගලිකවම ඇය පරපුරුෂ සේවනය යන අපරාධය සිදු කළ බවට චෝදනා යටතේ විනිසුරු හජ්ජි රිෂායි (Hadji Rezai) විසින් කඩිමුඩියේම එල්ලා මරා දැමීමට නියෝග කරන ලදි. එම නඩු විභාගය සම්බන්ධයෙන් වැරදිකරුවන් බවට පත් විනිසුරු රිෂායි ඇතුළු ආරක්ෂක හමුදා නිලධාරීන් කීප දෙනෙක්ද සිර භාරයට ගත් නමුදු ඊට ටික දිනකට පසු ඔවුන්ව නිදහස් කර ඇත.

ආරම්භයේ පටන්ම ස්ත්‍රී දූෂණය හා මිලේච්ඡ ඝාතන ක්‍රමිකව සිදු කරමින් තිබූ අතර අද දූෂණ හා මර්ධනය පවත්වාගෙන යන්නේ ජනතාව බිය වැද්දීමට ප්‍රයත්න දැරීම හා ජනතා අධ්‍යාත්මය බණ්ඩනය කිරීමටය; අද එවැනි තත්ත්වයන්ට විරුද්ධව ඔවුන් නැගී සිටිනු ඇත. මෙවැනි අපරාධ ජනතාව ප්‍රකෝපයට පත් කර ඇත; නීති විරෝධීව සඟවා තබා ගැනීමට ගත් උත්සාහයන් නිසා ජනතාව වඩාත් ප්‍රකම්පනයට පත්ව ඇත. දැන් අධිකාරීන් මේවා පිළිබඳ පරීක්ෂණ පැවැත්වීමට පොරොන්දු වී සිටී; ඉච්ඡාභංගත්වයට පත් අධිකාරීන් අනේකාකාර කොමිටි, කොමිෂන් පත්කරමින් සිටී; නමුත් බරපතල ලෙස සිත් තැවුලට පත් හා හිංසනයට පීඩනයට පත් ජනතාවගේ කෝපය සංසිඳවීමට ප්‍රමාද වූවා වැඩිය.

දූෂණයට පත් බොහෝ කාන්තාවන් කෲර ලෙස මරා දමා ඇත; තවත් කාන්තා පිරිසක් සිරගෙයින් නිදහස ලබා ඇති මුත්, ඔවුන් බරපතල කඩා වැටීමකට හෝ හිංසනකාරී හෙලා දැකීමට පත් කර තිබීම කොතරම් දරුණුද යත් ඔවුන් නිහඬභාවයේ ගිල්වා ඇත. බොහෝ දෙනෙක් ගැලවීමේ මගක් නොදනී. මෙම දූෂණයට හා හිංසාවන්ට පත් කාන්තාවන් තම බේදවාචකය පවුලේ උදවියගෙන් සඟවා ගෙන; බරපතල අපරාධයේ තාඩන පීඩන වලින් ලත් කම්පනය වසර ගණනක් විඳ දරා ගනිමින් හුදෙකලාව දිවි ගෙවති. සමහර තත්ත්වයන් යටතේ එම කාන්තාවන් සිය ස්වාමි පුරුෂයින් හා පවුලේ උදවිය සමග ඊට එරෙහිව නැගී සිටිති. මෑත සති කීපය තුළ, දේශපාලනයෙන් ඉවත් වූ කාන්තාවෝ පවා ඉතා ධෛර්‍ය සම්පන්නව නැගී සිටිමින් තමන්ට සිදුවූ බරපතල අපරාධය ගැන හඬ අවධි කරමින් සිටිති.

1980 ගණන්වල මුල් භාගයේ සිරභාරයට පත් කාන්තාවන් දෙදෙනෙක් වන, කුර්දිස්තානයේ සනාන්දාජ් (Sanandaj) වල අෂාර්-අල්-ඊ-කානන් (Azar Al-e-Kan'an) සහ මාෂ්හාඩ් වල කාටායොන් අෂාර්ලි (Katayoun Azarly) ඉරාන චිත්‍රපට නිෂ්පාදක රීෂා අල්ලමෙෂායේ (Reza Allamezadeh) සමඟ සම්මුඛ සාකච්ඡාවකට ඉදිරිපත්ව ඇත. (ඉංග්‍රීසි උප ශීර්ෂ සහිත සම්මුඛ සාකච්ඡා www.reza.malakut.org වෙබ් අඩවියෙන් හෝ, ''rape in prisons of Iran'' ලෙස ''YouTube'' හි සෙවීමට ලක් කිරීමෙන් දැනගත හැකිය) දශක තුනකට ආසන්න කාලයක් නිහඬතාවයකින් පසු වුවද, ඔවුහු තීරණය කර ඇත්තේ ඔවුන් ඉස්ලාමීය රාජ්‍ය පාලනයේ අපරාධ හා දූෂණ එළිදරව් කිරීම සහ ඊට එරෙහි නඩු සටන් පෙරමුණ විවෘත කරලීමය; එමෙන්ම තුච්ඡ අපරාධ කරුවන් තමන් කළ අපරාධ වලින් ගැලවී යන අතර මරණයට පත්, වද බන්ධනවලට මුණ දුන්, දූෂණයට ලක් වුවන් ''අවමානයට'' පත් කර නිහඬ කරන පැරණි හා ප්‍රතිගාමී සම්ප්‍රදායට එරෙහිව යන සටන් පෙරමුණක් නිර්මාණය කළ යුතු බවයි.

**දිනාගැනීමට ලොවක් ඇත ප්‍රවෘත්ති සේවය** (A World to Win News Service){aworldtowin.org}; ලෝකයේ මාක්ස්-ලෙනින්-මාඕවාදී පක්ෂ සහ සංවිධානවල කළලමය මධ්‍යස්ථානය වන විප්ලවීය ජාත්‍යන්තරවාදී ව්‍යාපාරයේ අනුග්‍රහයෙන් සිදු කරන ලද දේශපාලනික සහ න්‍යායික විමර්ශනය වන **දිනාගැනීමට ලොවක් ඇත සඟරාව** (A World to Win Magazine) විසින් ඉදිරිපත් කරන ලදි.

..................

*විප්ලවීය ඉරාන කාන්තාවන් සමග සම්මුඛ සාකච්ඡා සඳහා Revolution Online බලන්න;*

**''වෙනස් ලොවක් උදෙසා අරගල කිරීමට අවැසි ධෛර්‍ය, දැක්ම, සහ අධිෂ්ඨාන යේ ප්‍රවාදයක්''** - විප්ලවීය වාර්තාකරු මයිකල් ස්ලේට් (Michael Slate), 2008 ජාත්‍යන්තර කාන්තා දිනය ට සහභාගිවීම පිණිස ලොස් ඇන්ජලීස් නගරය බලා පිටත් වූ ඉරාන කාන්තාව සමග සම්මුඛ සාකච්ඡාවක් පවත්වයි.

*** විරෝධය පෑම තවමත් අඛණ්ඩව ඉදිරියට.....!** ඇනාහිටා (Anahita) කෲර වධ බන්ධනයට ලක් කළේය. කොමෙනි රාජ්‍ය පාලන සමයේ සිපිරි ගෙයි ඇය වසර අටක් සිරගත විය. විප්ලවීය ලේඛක ලී ඔනෙස්ටෝ මැතිණිය සම්මුඛ සාකච්ඡා පවත්වන්නේ ඉස්ලාමීය මූලධර්මවාදී රාජ්‍ය තන්ත්‍රයට හා ඇමෙරිකන් අධිරාජ්‍යවාදයට එරෙහිව නැගී සිටින ධෛර්‍ය සම්පන්න විප්ලවවාදී ඇනා (Ana) සමඟය.

නව මාක්ස්වාදී අධ්‍යයන කණ්ඩායමේ පරිවර්තනයකි

T 08



ඉරානයේ ඒකාධිපති පාලකයා අහමදිනිජාඩ්...




තුවාල ලත් දැරියක්...



කාන්තාවක ගල් ගසා මරා දැමීමට සූදානම් කෙරේ...



තරුණයන් කිහිප දෙනෙකු එල්ලා මරා දැමීමට සූදානම් කෙරේ...




එල්ලා මරණයට පත් කෙරුණු තරුණයන්...





පුළුල් මහජන සහභාගීත්වය දිගටම...







ආරක්ෂක නිලධාරීහු විරෝධතාවය මර්ධනය කරති...

අපට ප්‍රජාතන්ත්‍රවාදය අවශ්‍යයි...!









විරෝධතාවයේ උණුසුම් අවස්ථාවන් හි දී...









නෙඩා මරණයට පත් වූ අවස්ථාව...



සුන්දර නෙඩා ජීවමානය...






ආරක්ෂක නිළධාරීන්ගේ මෘග ප්‍රහාරයට හසුව...



කුපිත වූ තරුණයෝ ආරක්ෂක නිළධාරියෙකුට පහර දෙති...

නව මාක්ස්වාදී අධ්‍යයන කණ්ඩායම
T 08

http://slmarxist.yolasite.com
slmarxist@ymail.com